**සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය නෛතික සහයෝගීතාව දැක්වීම පිළිබඳව**

**මහජන චීන සමූහාණ්ඩුව,**

**සහ**

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**අතර**

**ඇතිකර ගන්නා ගිවිසුමයි.**

මෙහි මින්මතු ඇතැම් තැනක " පාර්ශ්වකරුවන් " වශයෙන් හඳුන්වනු ලබන, මහජන චීන සමූහාණ්ඩුව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය,

ඒ දෙරටේ මිත්‍රශීලී සම්බන්ධතාව මඟින් නියාමනය වෙමින් ද;

සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය නෛතික සහයෝගිතාවයේ පුළුල් ශක්‍ය ක්‍රියාමාර්ගවලට පහසුකම් සැපයීමේ අවශ්‍යතාව හඳුනාගනිමින්ද;

ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාව හා දේශසීමාවල අභ්‍යන්තරික කටයුතුවල දී මැදිහත් නොවීමේ මූලධර්මයන් යළිත් සපථ කරමින් ද;

සංවිධානාත්මක අපරාධ මැඩලීමේ ප්‍රවනතාව සහ එහි තීව්‍රතාව පෘථුල ලෙස සැලකිල්ලට ගෙන ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් සිදුවන සාපරාධී ක්‍රියාවන් සිදුකිරීම ඵලදායි ලෙස මර්දනය කිරීමේ අදිටනින්ද;

අපරාධවල සංකීර්ණ පැතිකඩ සහ බරපතළ ප්‍රතිවිපාක සම්බන්ධව ආකෘතීන් සහ ප්‍රතිමානයන් තුළ කටයුතු කිරීමේ දී සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය නෛතික සහයෝගිතාව පිළිබඳ ගිවිසුමක වැදගත්කම ඵලදායි පියවරක් වන බවට හඳුනාගනිමින් ද;

අපරාධ මර්දනය කිරීමේ දී, වැළැක්වීම, විමර්ශන පැවැත්වීම, නඩු පැවරීම හා නීති කෘත්‍ය ඉටුකිරීම මගින් සහයෝගීතාවයේ පුළුල් විභව ක්‍රියාමාර්ග එක් එක් රට සම්බන්ධයෙන් පළකිරීමට අපේක්ෂා කරමින් ද;

පහත සඳහන් පරිදි එකඟ වනු ලැබේ.

1 වන ව්‍යවස්ථාව

ගිවිසුම අදාල කර ගැනීමේ විෂය පථය .

01. ගිවිසුමේ විධිවිධාන අනුව පාර්ශ්වකරුවන් අපරාධ විමර්ශන, නඩු පැවරීම සහ සාපරාධී කාරණාවල දී අධිකරණ නීති කෘත්‍ය ඉටුකිරීම සම්බන්ධයෙන් පුළුල් අන්‍යෝන්‍ය නෛතික සහයෝගීතාව ලබාදිය යුතුය.

02. එම සහයෝගීතාවයට ,

(අ) අපරාධ නඩු කටයුතුවල දී ලේඛන භාරදීම ;

(ආ) තැනැත්තන්ගෙන් ප්‍රතිඥාවන් හෝ ප්‍රකාශයන් ලබා ගැනීම ;

(ඇ) භෞතික සාක්ෂි, ලේඛණමය සාක්ෂි, ශ්‍රව්‍ය සහ දෘෂ්‍ය සාක්ෂි සහ ඉලෙක්ට්‍රොනික දත්ත ආදියට සීමා නොවන නමුත් ඒවා ද ඇතුළුව සාක්ෂි සැපයීම ;

(ඇ) විශේෂඥවරුන්ගේ මත ලබා ගැනීම සහ සැපයීම ;

(ඉ) තැනැත්තන් සිටින ස්ථාන සහ ඔවුන් හඳුනාගැනීම ;

(ඊ) සෝදිසි කිරීම් ඉටුකිරීම හෝ ස්ථාන සහ විෂය වස්තු පරීක්ෂා කිරීම ;

(උ) සාක්ෂි ලබාදීමට හෝ විමර්ශනවල දී සහාය දීමට තැනැත්තන් ඉදිරිපත් කිරීම ;

(ඌ) සාක්ෂි දීමට හෝ විමර්ශනවල දී සහාය දීමට අත්අඩංගුවේ පසුවන තැනැත්තන් තාවකාලිකව මාරුකිරීම ;

(එ) පරීක්ෂණ , සෝදිසි කිරීම , අවහිර කිරීම සහ තහනමට ගැනීම ඉටුකිරීම ;

(ඒ) සාපරාධී කටයුතුවලින් ලත් මුදල් සහ අපරාධවල උපකරණත්වය සම්බන්ධයෙන් සහය දැක්වීම ;

(ඔ) අපරාධ නඩු කාර්ය පටිපාටි වලට අදාළ ප්‍රතිඵල දැනුම් දීම සහ අපරාධයට අදාළ වාර්තා සැපයීම ;

(ඕ) නීතිය පිළිබඳ තොරතුරු හුවමාරු කරගැනීම ;

සහ

(ක) ඉල්ලීම ලබන පාර්ශ්වයේ නීතිවලට පටහැනි නොවන යම් වෙනත් ආකාරයේ සහාය දැක්වීම් ;

ඇතුළත් වේ.

03. මෙම ගිවිසුම පාර්ශ්වකරුවන් අතර අන්‍යෝන්‍ය නෛතික සහයෝගීතාව දැක්වීම සඳහා පමණක් අදාල විය යුතුය. මෙම ගිවිසුමේ විධිවිධාන, යම් සාක්ෂියක් ලබා ගැනීමට, වසන් කිරීමට හෝ බැහැර කිරීමට හෝ යම් ඉල්ලීමක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ බාධාවක් ඇති කිරීම පිණිස පෞද්ගලිකත්වයෙහිලා සැලකෙන යම් තැනැත්තකුගේ අයිතියකට සම්බන්ධ නොවිය යුතුය.

## 2 වන ව්‍යවස්ථාව

## මධ්‍යම බලධාරීන්

01. මෙම ගිවිසුමේ කාර්යය සඳහා පාර්ශ්වකරුවන් විසින් නම් කරන මධ්‍යම බලධාරීන් විසින් අන්‍යෝන්‍ය නෛතික ඉල්ලීම් සහ සහයෝගීතාවන් පිළිබඳ කාරණාවන් ඔවුනොවුන් සමඟ ඍජුවම සන්නිවේදනය කළ යුතුය.

02. මෙම ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ සඳහන් මධ්‍යම බලධාරීන් සඳහා මහජන චීන සමූහාණ්ඩුව සඳහා අධිකරණ අමාත්‍යාංශය ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සඳහා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ද ඇතුලත් විය යුතුය.

03. දෙපාර්ශ්වයෙන් යම් කවරම වූ එක් පාර්ශවයක් ස්වකීය නාමෝද්දිෂ්ට මධ්‍යම බලධාරියා වෙනස් කළ අවස්ථාවක, ඒ බව අනෙක් පාර්ශ්වයට රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් දැනුම් දිය යුතුය.

## 3 වන ව්‍යවස්ථාව

## සහාය ලබාදීම ප්‍රතික්ෂේප කිරීම

01. මෙහි පහත සඳහන් යම් කවරම වූ එක් අවස්ථානුගත හේතුවක් පදනම් කරගෙන සහාය ලබාදීම, ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් ප්‍රතික්ෂේප කළ හැකිය.

(අ) ඉල්ලීම, ඉල්ලීම ලබන පාර්ශ්වයේ නීති යටතේ වරදක් සංයුක්ත නොවන ක්‍රියාකලාපයකට සම්බන්ධ වීම. එසේ වුවත් ඉල්ලීම ලබන පාර්ශ්වයේ නීති යටතේ වරදක් සංයුක්ත වන ක්‍රියාකලාපයක් නොතකා , යම් සුවිශේෂී ඉල්ලීමක් සඳහා සහාය ලබා දීමට ඉල්ලීම ලබන පාර්ශ්වය එකඟ විය හැකිය.

(ආ) ඉල්ලීම දේශපාලන වරදකට සම්බන්ධ වන බවට ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් සැලකීම. මෙම ගිවිසුම අදාල කර ගැනීමේ දී පහත සඳහන් වරදවල් දේශපාලනමය වරදවල් වශයෙන් නොසැලකිය යුතුය. එනම් ;

(i) ත්‍රස්තවාදයට සම්බන්ධ වරදක් ;

(ii) මෙම ගිවිසුමේ පාර්ශ්වකරුවන් වන ද්විත්ව රාජ්‍යයන් යම් ජාත්‍යන්තර සම්මුතියක් යටතේ දේශපාලනමය වරදක් වශයෙන් නොසලකන වරදක්;

සහ

(iii) මෙම ගිවිසුමේ පාර්ශවයන් වන රාජ්‍යයන්හි රාජ්‍ය නායකයන්ගේ හෝ රජයේ ප්‍රධානියෙකුගේ හෝ ඔවුන්ගේ පවුල්වල සමීපතමයකු සම්බන්ධ වරදක් සම්බන්ධයෙන් ;

(ඇ) ඉල්ලීම හමුදා නීතිය යටතේ වරදක් පමණක් සංයුක්ත වන වරදක්;

(ඈ) යම් තැනැත්තකුගේ ජනවර්ගය , ස්ත්‍රී පුරුෂ භාවය , ආගම , ජාතිය හෝ දේශපාලන මතය හෝ ඒ තැනැත්තාගේ තරාතිරමට මෙම යම් කවරම වූ හේතුවක් මඟින් අගතියක් සිදුවී තිබීම නිසා හෝ ඒ තැනැත්තාට එරෙහිව විමර්ශනයක්, නඩු පැවරීමක් , දඬුවම් කිරීමක් හෝ වෙනත් නීති කෘත්‍යයක් ඉටුකිරීමේ කාර්ය සඳහා ඉල්ලීමක් කර ඇති බවට විශ්වාස කිරීමට ඉල්ලීම ලබන පාර්ශ්වයට සැලකිය යුතු හේතු පැවතීම.

(ඉ) ඉල්ලීමට අදාලව එකම වරද සඳහා එකම සැකකරුවෙකුට හෝ වූදිතයකුට එරෙහිව ඉල්ලීම ලබන පාර්ශවයේ අපරාධ නඩු කටයුතු අවසන් කර තිබීම හෝ දැනටමත් අවසානාත්මක නඩු තීන්දුවක් ලබාගෙන තිබීම ;

(ඊ) ඉල්ලීමක් ඉටු කිරීම ඉල්ලීම ලබන පාර්ශ්වයේ ස්වෛරීභාවයට, භෞමික අඛණ්ඩතාවයට, ආරක්ෂාවට, මහජන සාමයට හෝ රාජ්‍ය ප්‍රතිපත්තියට හානිකර වන බවට ඉල්ලීම ලබන පාර්ශ්වය විශ්වාස කිරීම ;

02. යම් ඉල්ලීමක් ඉටු කිරීම, ඉල්ලීම ලබන පාර්ශ්වයේ දැනට කරන විමර්ශන කටයුතු , නඩු පැවරීම හෝ අපරාධ නඩු කටයුතුවලට බාධා වන විටක , සහාය ලබා දීම ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් කල් දැමිය හැකිය.

03. යම් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමට හෝ ඒ ඉල්ලීම ඉටුකිරීම කල් දැමීමට පෙර, ඉල්ලීම ලබන පාර්ශවය විසින් අවශ්‍ය බවට සලකන කොන්දේසිවලට යටත්ව සහාය ප්‍රදානය කල හැකිද යන්න සැලකිය යුතුය. එම කොන්දේසිවලට යටත්ව ඉල්ලීම කරන පාර්ශ්වය සහාය ලබා ගැනීමට එකඟ වන්නේ නම්, ඉල්ලීම කරන පාර්ශ්වය ඒ කොන්දේසි වලට අනුකූල විය යුතුය.

04. සහාය ලබාදීම ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් ප්‍රතික්ෂේප කිරීම හෝ කල්දැමීම කරන්නේ නම් , ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් එම ප්‍රතික්ෂේප කිරීම හෝ කල්දැමීම පිලිබඳව ඉල්ලීම කරන පාර්ශ්වයට දැන්විය යුතුය.

## 4 වන ව්‍යවස්ථාව

## ඉල්ලීමක ආකෘතිය හා අඩංගු කරුණු

01. සහාය ලබා ගැනීම සඳහා කරන ඉල්ලීමක් ලියවිල්ලකින් විය යුතු අතර, ඊට ඉල්ලීම කරනු ලබන පාර්ශ්වයේ මධ්‍යම බලධාරියාගේ අත්සන හෝ නිල මුද්‍රාව තැබිය යුතුය. එසේ වුවද , හදිසි අවස්ථාවකදී ඉල්ලීම ලබන පාර්ශ්වය එකඟ වන පරිදි ඉල්ලීම කරන පාර්ශ්වය විදුලි පණිවිඩ , ෆැක්ස් හෝ විද්‍යුත් තැපැල වැනි ක්‍රම මගින්ද ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර ඉල්ලීම කරන පාර්ශ්වය විසින් එකී ඉල්ලීම ඉන්පසුව වහාම ලියවිල්ලකින් තහවුරු කළ යුතුය.

02. සහාය ලබා ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීමක පහත කරුණු අඩංගු විය යුතුය.

(අ) ඉල්ලීමට අදාලව විමර්ශන පැවැත්වීම, නඩු පැවරීම හෝ අධිකරණ කටයුතු සිදු කරන නිසි බලධාරියාගේ නම ;

(ආ) ඉල්ලීමට අදාල වන නඩුවේ ස්වභාවය හා කරුණු පිලිබඳ විස්තරයක් හා අදාල නීතියේ විධිවිධාන අඩංගු නීති පාඨ ;

(ඇ) ඇයැද සිටින සහාය පිළිබඳ විස්තරයක් , සහාය ඇයදීමේ අරමුණ හා ඇයැද සිටින සහාය , සහ එය නඩුවට අදාල වන ආකාරය ;

සහ

(ඈ) ඉල්ලීම ඉටු කිරිමට අපේක්ෂා කරන කාල සීමාව.

03. සහාය ලබා ගැනීම සඳහා වන ඉල්ලීමකට , අවශ්‍යතාවයේ හා ශක්‍යතාවයේ ප්‍රමාණයට , පහත දෑ අඩංගු විය යුතුය.

(අ) සාක්ෂි ලබා ගැනීමට අපේක්ෂා කරන තැනැත්තාගේ අනන්‍යතාවය හා පදිංචි තොරතුරු ;

(ආ) ලේඛන භාර දීමට අපේක්ෂා කරන තැනැත්තාගේ අනන්‍යතාවය හා පදිංචිය හා නඩුකටයුතුවලට ඒ තැනැත්තාගේ සම්බන්ධතාව පිළිබඳ තොරතුරු ;

(ඇ) කවර ස්ථානයක සිටින්නේද යන්න හෝ හඳුනාගැනීම සඳහා අවශ්‍ය කරන තැනැත්තාගේ අනන්‍යතාවය හා පදිංචිව සිටින ස්ථානය පිළිබඳ තොරතුරු ;

(ඇ) සෝදිසි කිරීමට හෝ පරීක්ෂා කිරීමට අපේක්ෂා කරන විෂය වස්තුවේ විස්තරයක් ;

(ඉ) පරීක්ෂා කිරීමට, සෝදිසි කිරීමට, අවහිර කිරීමට හෝ තහනමට ගැනීමට අපේක්ෂා කරන දේපළ විස්තරයක් ;

(ඊ) ඉල්ලීමක් ඉටුකිරීමේ දී අනුගමනය කිරීමට අපේක්ෂා කරන යම් විශේෂ කාර්ය පටිපාටියක් පිළිබඳ විස්තරයක් හා ඊට පාදක වන හේතු ;

(උ) රහස්‍යභාවයේ අවශ්‍යතාව පිළිබඳ විස්තරයක් හා ඊට හේතු ;

(ඌ) සාක්ෂි දීමට හෝ විමර්ශනවලට සහාය දීමට ඉල්ලීම කරන පාර්ශ්වයේ පෙනී සිටීමට ඇරයුම් ලබන තැනැත්තා සම්බන්ධ දීමනා හා වියදම් පිළිබඳ තොරතුරු ;

(එ) සාක්ෂිකරුවන් විසින් උත්තර සැපයිය යුතු ප්‍රශ්න ලැයිස්තුව ;

සහ

(ඒ) ඉල්ලීමක් ඉටු කිරීමට පහසුකම් සලසනු ලැබිය හැකි එවැනි වෙනත් තොරතුරු .

04. ඉල්ලීම ලබන පාර්ශ්වයට ඉල්ලීමක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ඉල්ලීමේ අඩංගු කරුණු ප්‍රමාණවත් නොවන බව පෙනීයන විටෙක ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් අතිරේක තොරතුරු ඉල්ලා සිටිය හැකිය.

05. මෙම ගිවිසුම අනුව කෙරෙන ඉල්ලීම් සහ ඊට අදාළ වෙනත් සෙසු ලේඛන පිටපත් දෙකකින් යුක්ත විය යුතුය.

5 වන ව්‍යවස්ථාව

භාෂාව

මෙම ගිවිසුම සම්බන්ධයෙන් ඉදිරිපත් කලයුතු ඉල්ලීම් සහ සහායක ලේඛන, ඉල්ලීම ලබන පාර්ශ්වයේ රාජ්‍ය භාෂාවෙන් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් පරිවර්තනය කොට ඉදිරිපත් කළ යුතුය.

6 වන ව්‍යවස්ථාව

ඉල්ලීම් ක්‍රියාත්මක කිරීම

01. ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් තම දේශීය නීතිවලට අනුකූලව සහාය සඳහා වූ ඉල්ලීම ක්‍රියාත්මක කළ යුතුය.

02. ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන පාර්ශ්වය විසින් ඉල්ලා සිටින ආකාරයට දේශීය නීතිවලට අනුකූල වන ආකාරයෙන්, ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් සහාය සඳහා වූ එකී ඉල්ලීම ක්‍රියාත්මක කළ හැකිය.

03. ඉල්ලීම ක්‍රියාත්මක කිරීමෙන් පසු ඇතිවන ප්‍රතිඵලය පිළිබඳ ව ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වය වෙත කඩනමින් දැනුම් දිය යුතුය. ඉල්ලා ඇති සහාය සැපයිය නොහැකි නම් හෝ ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වය විසින් නිශ්වය කර ඇති කාල සීමාව තුල එකී සහාය ප්‍රදානය කිරිමට නොහැකි නම් ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වය වෙත ඊට හේතු කඩිනමින් ඉදිරිපත් කළ යුතුය.

7 වන ව්‍යවස්ථාව

රහස්‍යභාවය සහ භාවිතය සීමා කිරීම

ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන පාර්ශ්වය විසින් ඉල්ලා සිටින්නේ නම් ,

01. ඉල්ලීමේ අන්තර්ගතය, සහායක ලියවිලි සහ ඉල්ලීම සම්බන්ධයෙන් ගෙන ඇති යම් ක්‍රියාමාර්ග ඇතුලුව එකී ඉල්ලීම සම්බන්ධ තොරතුරු ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් රහසිගතව තබා ගත යුතුය. එකී රහස්‍යභාවය උල්ලංඝනය කිරීමකින් තොරව ඉල්ලීම ක්‍රියාත්මක කළ නොහැකි නම්, ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වය වෙත ඒ බව දැනුම් දිය යුතු අතර එවිට ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වය විසින් එකී ඉල්ලීම ක්‍රියාත්මක කළ යුතු ද යන්න තීරණය කළ යුතුය.

02. ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් ඉල්ලා සිටින්නේ නම් ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් සපයනු ලබන තොරතුරු සහ සාක්ෂි, ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන පාර්ශ්වය විසින් රහසිගත ව තබා ගත යුතු අතර, එසේ නැතහොත් ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් නිශ්චය කර ඇති නියමයන් සහ කොන්දේසි යටතේ පමණක් එකී තොරතුරු හෝ සාක්ෂි භාවිතා කළ යුතුය.

03. ඉල්ලීම ලබන පාර්ශ්වයේ පූර්ව එකඟතාව නොමැතිව ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වය විසින් ඉල්ලීමේ සඳහන් කාරණාවන්ට හැර වෙනත් යම් කාරණා සඳහා මෙම ගිවිසුම යටතේ ලබාගත් යම් තොරතුරු හෝ සාක්ෂි භාවිතා නොකළ යුතුය.

8 වන ව්‍යවස්ථාව

ලේඛන භාරදීම

01. ඉල්ලීම ලබන පාර්ශවය විසින් තම දේශීය නීති අනුව සහ අදාළ ඉල්ලීම මත ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වය විසින් එවනු ලබන ලේඛන භාරදිය යුතුය. එසේ වුවද වූදිතයකු වශයෙන් පෙනී සිටීම සඳහා අවශ්‍ය කරන ලේඛන එසේ භාර දීම, ඉල්ලීම ලබන පාර්ශ්වයේ බැඳීමක් නොවිය යුතුය.

02. ලේඛන භාරදීමෙන් අනතුරුව, ඉල්ලීම ලබන පාර්ශ්වය විසින්, එකී ලේඛන භාරදුන් දිනය, ස්ථානය සහ භාරදුන් ආකාරය සඳහන් කරමින් සහ ලේඛන භාරදුන් අධිකාරය විසින් අත්සන් තබා සහ / හෝ මුද්‍රාව තබා එම ලේඛන භාරදුන් බවට තහවුරු කිරීමක්, ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශවය වෙත සැපයිය යුතුය.

9 වන ව්‍යවස්ථාව

සාක්ෂි ලබා ගැනීම

01. ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් තම රටේ දේශිය නීති අනුව සහ අදාළ ඉල්ලීම මත සාක්ෂි ලබාගත යුතු අතර, ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වය වෙත එකී සාක්ෂිය සැපයිය යුතුය.

02. ඉල්ලීම ලේඛන හෝ වාර්තා යැවීම සම්බන්ධයෙන් වන විටක, ඉල්ලීම ලබන පාර්ශවය විසින් ඒවායේ සහතික කළ පිටපත් හෝ ඡායා පිටපත් යැවිය හැකිය. කෙසේ වුවද, ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වය වෙත පැහැදිලිවම එම ලේඛනවල මුල් පිටපත් යැවීම අවශ්‍ය වන අවස්ථාවක ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් හැකි තරම් දුරට එකී ඉල්ලීම ඉටු කළ යුතුය.

03. ඉල්ලීම ලබන පාර්ශ්වයේ දේශීය නීතිවලට පටහැනි නොවන පරිදි, මෙම වගන්තිය අනුව ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වය වෙත යැවීමට නියමිත ලේඛන සහ අනෙකුත් ද්‍රව්‍ය, ඉල්ලීම ලබන පාර්ශවයේ දේශීය නීතිවලට අනුව සාක්ෂි වශයෙන් අවශ්‍ය වන පරිදි ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශවය විසින් ඉල්ලා ඇති අයුරින් සහතික කළ යුතුය.

04. ඉල්ලීම ලබන පාර්ශ්වයේ දේශීය නීතිවලට පටහැනි නොවන පරිදි, ඉල්ලීම ක්‍රියාත්මක කිරීමේ දී අදාළ ඉල්ලීමේ නිශ්චය කර ඇති එකී තැනැත්තන්ට පෙනී සිටීමට ඉල්ලීම ලබන පාර්ශ්වයේ නිසි අධිකාරය ඇති තැනැත්තන් හරහා සාක්ෂිකරුවන් වෙතින් සාක්ෂි ලබාගැනීමට ඉඩ ලබාදිය හැකිය. මෙම කාර්යය සඳහා අදාළ ඉල්ලීම ක්‍රියාත්මක කරන වේලාව සහ ස්ථානය ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වය වෙත වහාම දැනුම් දිය යුතුය.

## 10 වන ව්‍යවස්ථාව

## සාක්ෂි ලබාදීම ප්‍රතික්ෂේප කිරීම

01. සමාන අවස්ථානුගත කරුණු මත යම් පාර්ශ්වයක දේශීය නීති යටතේ සාක්ෂි ලබා නොදීමට යම් තැනැත්තකුට අවසර ලබාදේ නම්, මෙම ගිවිසුම යටතේ සාක්ෂි ලබාදීම අවශ්‍ය කෙරෙන තැනැත්තකුට එසේ සාක්ෂි ලබාදීම ප්‍රතික්ෂේප කළ හැකිය.

02. ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වයේ දේශීය නීති යටතේ මෙම ගිවිසුම යටතේ සාක්ෂි දීමට අවශ්‍ය කෙරෙන යම් තැනැත්තකු සාක්ෂි දීමේ දී නඩු නොපැවරීමේ අයිතිය හෝ වරප්‍රසාද සඳහා හිමිකම් පාන්නේ නම් ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් එකී තැනැත්තාගේ මතය ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වය වෙත දැනුම් දිය යුතු අතර, ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වය විසින් එකී ඉල්ලීම හෝ වරප්‍රසාදය පවතින්නේද යන්න සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය කෙරේ. ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශවය

විසින් සපයනු ලබන සාක්ෂි, එකී අයිතිය හෝ වරප්‍රසාදය පවතින්නේ ද නැතහොත් ඊට පටහැනිව සාක්ෂි ඇති බවට ප්‍රමාණවත් තහවුරු කිරීමක් වශයෙන් සැළකිය යුතුය.

11 වන ව්‍යවස්ථාව

සාක්ෂි ලබාදීම හෝ විමර්ශන සම්බන්ධයෙන් සහාය දීම සඳහා

තැනැත්තන් ඉදිරිපත් කිරීම

01. ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වයේ ඉල්ලීම මත සාක්ෂි ලබාදීම හෝ විමර්ශන සඳහා සහායවීම පිණිස ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වයේ දේශ සීමාව තුළ අදාළ අධිකාරීන් ඉදිරියේ පෙනී සිටින ලෙස, ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් අදාල තැනැත්තන් වෙතින් ඉල්ලා සිටිය යුතුය. එකී තැනැත්තා වෙත කවර සීමාවක් දක්වා දීමනා සහ වියදම් ගෙවනු ලබන්නේද යන්න ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වය විසින් සඳහන් කළ යුතුය. එකී තැනැත්තාගේ ප්‍රතිචාර පිළිබඳ ව ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශවය වෙත වහාම දැනුම් දිය යුතුය.

02. ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වයේ දේශ සීමාව තුළ දී සාක්ෂි ලබාදීමට හෝ විමර්ශන සඳහා සහාය දැක්වීමට පෙනී සිටීම සඳහා යම් තැනැත්තකු වෙතින් කරන ඉල්ලීම, එලෙස පෙනී සිටීමට නියමිත දිනට දින 60 කට නොඅඩු කාලයකට පෙරාතුව ඉදිරිපත් කළ යුතුය. හදිසි අවස්ථාවන්හි දී කෙටි කාලසීමාවක් තුළ එකී ක්‍රියාදාමය ඉටු කිරීමට ඉල්ලීම ලබන පාර්ශ්වය එකඟ විය හැකිය.

12 වන ව්‍යවස්ථාව

සාක්ෂි ලබාදීම හෝ විමර්ශන සඳහා සහායවීම පිණිස

සිරභාරයේ සිටින තැනැත්තන් භාරදීම

01. භාරදීමට නියමිත තැනැත්තා එකඟ වේ නම්, සහ භාර දීම පිළිබඳ කොන්දේසි සම්බන්ධයෙන් පූර්ව ලිඛිත ගිවිසුමකට දෙපාර්ශ්වයන් එකඟව ඇත්නම්, ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වයේ ඉල්ලීම මත සාක්ෂි ලබාදීම හෝ විමර්ශන සඳහා සහාය දැක්වීම පිණිස ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වයේ දේශ සීමාව වෙත, සිරභාරයේ රඳවා ඇති තැනැත්තන් තාවකාලිකව භාරදීමට ඉල්ලීම ලබන පාර්ශ්වයට හැකිය.

02. භාරදෙන තැනැත්තා ඉල්ලීම ලබන පාර්ශ්වයේ දේශීය නීති යටතේ රඳවා තැබීම අවශ්‍ය කෙරේ නම්, ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වය විසින් එම තැනැත්තා එලෙස රඳවා තැබිය යුතුය.

03. සාක්ෂි ලබාදීම හෝ විමර්ශන සඳහා සහාය දැක්වීම අවසන් වූ වහාම ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වය විසින් එම තැනැත්තා ලබන පාර්ශ්වය වෙත ආපසු භාරදිය යුතුය.

04. මෙම වගන්තියේ කාර්යය සඳහා, එසේ භාර දෙන තැනැත්තාට, ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වයේ දේශ සීමාව තුළදී ගෙවන ලද දඬුවම් කාලය වෙනුවෙන් ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් පනවන ලද දඬුවම විඳීමේදී වාසියක් ලැබිය යුතුය.

13 වන ව්‍යවස්ථාව

සාක්ෂිකරුවන් සහ විශේෂඥ දැනුම ඇති තැනැත්තන් ආරක්ෂා කිරීම

01. මෙම ගිවිසුම යටතේ ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වයේ දේශ සීමාව තුළට ප්‍රවේශ වන යම් සාක්ෂිකරුවකු හෝ විශේෂඥ දැනුම ඇති තැනැත්තකු එකී දේශ සීමාව වෙත ප්‍රවේශ වීමට පෙරාතුව සිදුකළ යම් ක්‍රියා හෝ පැහැර හැරීම් සම්බන්ධයෙන් ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වය විසින් එකී තැනැත්තා විමර්ශනයට ලක් කිරීම, නඩු පැවරීම, රඳවා තබා ගැනීම, දඬුවම් කිරීම හෝ වෙනත් ආකාරයක පුද්ගල නිදහස සීමා කිරීමකට යටත් කිරීම හෝ සිදු නොකළ යුතු අතර, ඉල්ලීම ලබන පාර්ශ්වයේ සහ අදාළ තැනැත්තාගේ පූර්ව අනුමැතිය නොමැතිව ඉල්ලීමට අදාළ වන කාරණය හැර වෙනත් කාරණා සම්බන්ධයෙන් සාක්ෂි ලබාදීමට හෝ විමර්ශන සඳහා සහාය දැක්වීමට, නඩු පැවරීමට හෝ වෙනත් නීති කෘත්‍යයන් හා සම්බන්ධ වීමට එකී තැනැත්තා යටත් නොකළ යුතුය.

02. මෙම ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ සඳහන් කර ඇති තැනැත්තා වෙත ඔහුගේ/ඇයගේ පෙනී සිටීම තවදුරටත් අවශ්‍ය නොවන බවට නිල වශයෙන් දැනුම්දීමෙන් දින පහළොවකට පසුව ද ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශවයේ දේශ සීමාව තුළ නැවතී සිටී නම් හෝ පිටත්වීමෙන් අනතුරුව ඔහු හෝ ඇය ස්වේඡාවෙන්ම ආපසු පැමිණ ඇත්නම් මෙම ව්‍යවස්ථාවේ 1 වන ඡේදය අදාළ කර නොගත යුතුය. එනමුදු ඔහුගේ /ඇයගේ පාලනයෙන් තොර හේතු කාරණා මත ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශවයේ දේශ සීමාවෙන් පිට වීමට එකී තැනැත්තා අපොහොසත් වූ කාල පරිච්ඡේදය මෙම කාලසීමාවට ඇතුළත් නොකළ යුතුය.

03. මෙම ගිවිසුමේ 11 සහ 12 වන ව්‍යවස්ථාවන්ට අනුකූලව සාක්ෂි දීම හෝ විමර්ෂණයට සහාය දැක්වීම ප්‍රතික්ශේප කරන පුද්ගලයෙකු එකී ප්‍රතික්ශේප කිරීම නිසා කිසිදු දණ්ඩනයකට හෝ කිසිදු පුද්ගල නිදහස සීමා කිරීමකට ලක් නොවිය යුතුය

14 වන ව්‍යවස්ථාව

පරීක්ෂණ පැවැත්වීම, විමර්ශනය කිරීම, පවරා ගැනීම සහ තහනමට ගැනීම

01. ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් පරීක්ෂණ පැවැත්වීමේ, විමර්ශනය කිරීමේ සාක්ෂිමය ලියවිලි, ලේඛන සහ වත්කම් පවරා ගැනීමේ හා තහනමකට ගැනීමේ ඉල්ලීමක් දේශීය නීතිය මගින් අවසර ලබා දෙන ප්‍රමාණයට ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය.

02. ඉල්ලීම ලබන පාර්ශ්වය පරීක්ෂණ පැවැත්වීම හෝ විමර්ශනය කිරීම , පවරා ගැනීම හෝ තහනමට ගැනීම සිදු කරන ස්ථානය සහ තත්ත්වය සහ එකී ලියවිලි, ලේඛන සහ වත්කම්වල පසු ආරක්ෂාව ඇතුලුව ඉල්ලීම ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල ඉල්ලීම කරනු ලබන පාර්ශ්වය වෙත ලබා දිය යුතුය.

03. ඉල්ලීම ලබන පාර්ශ්වය තහනමට ගත් ලියවිලි ,ලේඛන හෝ වත්කම් ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන පාර්ශ්වය විසින් යෝජනා කරනු ලබන එම පැවරීම පිළිබඳ නියම හා කොන්දේසිවලට එකඟ වන්නේ නම්, එසේ තහනමට ගත් ලියවිලි, ලේඛන හෝ වත්කම් ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන පාර්ශ්වය වෙත පැවරිය හැකිය.

15 වන ව්‍යවස්ථාව

සාක්ෂිමය ලියවිලි, වාර්තා සහ ලේඛන ආපසු භාර දීම

ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් කරනු ලබන ඉල්ලීමකට අනුව ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන පාර්ශ්වය විසින් ඉල්ලීම ලබන පාර්ශ්වය වෙත ලබා දෙනු ලැබූ සාක්ෂිමය ලියවිලි, වාර්තා සහ ලේඛනවල මුල් පිටපත් මෙම ගිවිසුමේ 9 සහ 14 වගන්ති යටතේ හැකි ඉක්මනින් ඉල්ලීම ලබන පාර්ශ්වය වෙත ලබා දිය යුතුය.

16 වන ව්‍යවස්ථාව

අපරාධ මගින් ලත් භාණ්ඩ හෝ මුදල් සහ අපරාධය සිදු කිරීම සඳහා යොදා ගත් ද්‍රව්‍ය

01. ඉල්ලීම මත ඉල්ලීම ලබන පාර්ශ්වය අපරාධ මගින් ලත් භාණ්ඩ හෝ මුදල් අපරාධය සිදු කිරීම සඳහා යොදා ගත් ද්‍රව්‍ය එහි දේශසීමාව තුළ තිබේද යන්න නිශ්චිත ව දැන ගැනීම සඳහා ප්‍රයත්න දැරිය යුතු අතර, ඉල්ලීම ඉදිරිපත් කරන පාර්ශ්වයට ප්‍රතිඵලය පිළිබඳ ව දැනුම් දිය යුතුය. ඉල්ලීම සිදු කිරීමේදී, ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන පාර්ශ්වය අනෙක් පාර්ශවයේ දේශසීමාව තුළ ඉහත සඳහන් කළ ලත් මුදල් සහ අපරාධය සඳහා යොදා ගත් ද්‍රව්‍ය තිබීමේ හේතූන් පිළිබඳ ව ඉල්ලීම ලබන පාර්ශ්වය දැනුවත් කල යුතුය.

02. මෙම වගන්තියේ 1 වන ඡේදයට අනුව සැක සහිත ලත් මුදල් සහ ලැබීම් හෝ අපරාධය සිදු කිරීමට යොදා ගත් ද්‍රව්‍ය හමු වූ අවස්ථාවක, ඉල්ලීම ලබන පාර්ශ්වය ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන පාර්ශ්වයේ ඉල්ලීම මත එම ලත් මුදල් හෝ ලැබීම් හෝ අපරාධය සිදු කිරීමට යොදා ගත් ද්‍රව්‍ය පවරා ගැනීමට සහ රාජසන්තක කිරීම සඳහා දේශීය නීති අනුව පියවර ගත යුතුය.

03. ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන පාර්ශ්වයේ ඉල්ලීම මත ඉල්ලීම ලබන පාර්ශ්වයට දේශීය නීතිය මගින් අවසර ලබා දෙන ප්‍රමාණයට සහ පාර්ශ්වයන් එකඟතාවයකට පැමිණි නියම සහ කොන්දේසි යටතේ අපරාධය මගින් ලත් මුදල් සහ ලැබීම් හෝ අපරාධය සිදු කිරීම සඳහා යොදා ගත් ද්‍රව්‍ය හෝ එවැනි වත්කම් අලෙවි කිරීමෙන් ලත් මුදල් සියල්ලම හෝ ඉන් කොටසක් ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන පාර්ශ්වයට පැවරිය හැකිය.

04. මෙම ව්‍යවස්ථාව අදාළ කර ගැනීමේ දී එම ලත් මුදල් හෝ ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඉල්ලීම ලබන පාර්ශ්වය සහ යම් තුන්වන පාර්ශ්වයක නීත්‍යානුකූල අයිතිවාසිකම් සහ අභිලාෂයන්ට ගරු කළ යුතුය.

17 වන ව්‍යවස්ථාව

අපරාධ කාරණා පිළිබඳ නීති කෘත්‍යයක ප්‍රතිඵල පිළිබඳ ව දැනුම් දීම

ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන පාර්ශ්වය, එම ඉල්ලීම මගින් අපේක්ෂා කරන සහයෝගිතාව සම්බන්ධ අපරාධ සම්බන්ධ නීති කෘත්‍යයේ ප්‍රතිඵලය පිළිබඳ ව ඉල්ලීම ලබන පාර්ශ්වය දැනුවත් කළ යුතුය.

18 වන ව්‍යවස්ථාව

අපරාධ පිළිබඳ වාර්තා භාර දීම

ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන පාර්ශ්වයේ යම් තැනැත්තකු පිළිබඳ විමර්ශනය කිරීම හෝ යම් තැනැත්තෙකුට එරෙහි ව නඩු පවරා ඇත්නම් ඉල්ලීම ලබන පාර්ශ්වය විසින් අදාළ ඉල්ලීම ලැබීමෙන් අනතුරුව එම තැනැත්තා පිළිබඳ අපරාධ වාර්තා ඉල්ලීම කරනු ලබන පාර්ශ්වය වෙත භාර දිය යුතුය.

19 වන ව්‍යවස්ථාව

නීතිය පිළිබඳ තොරතුරු හුවමාරු කිරීම

දෙපාර්ශ්වයන්, මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීම හෝ ඊට අදාළ කරුණු සම්බන්ධයෙන් ස්වකීය රටවල පවත්නා දේශීය නීති සහ අධිකරණමය චර්යාවන් පිළිබඳ තොරතුරු ඉල්ලීම මත අන්‍යෝන්‍ය වශයෙන් ලබා දිය යුතුය.

20 වන ව්‍යවස්ථාව

සහතික කිරීම

මෙම ගිවිසුමට අනුව ගිවිසුමෙහි අරමුණ වෙනුවෙන් භාර දෙන ලද කවර හෝ ලේඛනයක් සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් විධිවිධාන සළස්වා ඇත්නම් මිස කිසිදු ආකාරයක සහතික කිරීමක් අවශ්‍ය නොවන්නේය.

21 වන ව්‍යවස්ථාව

වියදම්

01. ඉල්ලීම ලබන පාර්ශ්වය ඉල්ලීම ක්‍රියාත්මක කිරීමේ දී දරන පිරිවැය දැරිය යුතු අතර ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන පාර්ශ්වය පහත සඳහන් වියදම් දැරිය යුතුය.

(අ). මෙම ගිවිසුමේ 9 වන ව්‍යවස්ථාවේ 4 වන වගන්තියේ පරිදි, තැනැත්තන් ඉල්ලීම ලබන පාර්ශ්වය වෙත යාමට, එහි නවාතැන් ගැනීමට සහ ඉල්ලීම ලබන පාර්ශ්වයෙන් පිටත් වීමට දරන වියදම් ;

(ආ). මෙම ගිවිසුමෙහි 11 හෝ 12 ව්‍යවස්ථා වලට අනුව තැනැත්තන්ට ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන පාර්ශ්වය වෙත යාම, එහි නවාතැන් ගැනීම සහ පිටත් වීම සඳහා වන දීමනා හෝ වියදම් එම දීමනා සහ වියදම් දරනු ලබන ස්ථානයේ ප්‍රමිතීන් හෝ රෙගුලාසිවලට අනුකූල වන අයුරින් ලබා දීම ;

(ඇ). විශේෂඥයන්ගේ අදහස් ලබා ගැනීම සඳහා ගෙවිය යුතු වියදම් ;

සහ

(ඈ). පරිවර්තනය සහ අර්ථකථනය සඳහා වන වියදම්

ඇතුළත් ය.

02. ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන පාර්ශ්වය විසින් ඉල්ලීම මත දැරීමට අපේක්ෂා කරනු ලබන පූර්ව ගෙවීම් සිදු කළ යුතුය.

03. ඉල්ලීම ක්‍රියාත්මක කිරීමේ දී විශේෂ වියදම් දැරීමට සිදු වන බව පැහැදිලි වන්නේ නම්, ඉල්ලීම ක්‍රියාත්මක කිරීම සඳහා නියම සහ කොන්දේසි තීරණය කිරීම පිණිස දෙපාර්ශ්වයන් සාකච්ඡා කළ යුතුය.

## 22 වන ව්‍යවස්ථාව

## සහයෝගීතාවය සඳහා පදනම් වන වෙනත් කරුණු

අදාළ ජාත්‍යන්තර ගිවිසුම් හෝ එහි දේශීය නීතිවලට අනුව, එක් පාර්ශ්වයක් විසින් ඒ අනෙක් පාර්ශ්වය වෙත සහාය දැක්වීම නොවලක්වනු ලැබිය යුතුය. වෙනත් සැලැස්මක්, ගිවිසුමක් හෝ සම්ප්‍රදායන් අනුව දෙපාර්ශ්වයන්ට අන්‍යෝන්‍ය වශයෙන් සහාය දැක්විය හැකිය.

23 වන ව්‍යවස්ථාව

ආරාවුල් නිරාකරණය

මෙම ගිවිසුම නිර්වචනය කිරීමේ දී හෝ අදාළ කර ගැනීමේ දී පැන නැගිය හැකි යම් ආරාවුලක් සම්බන්ධයෙන් දෙපාර්ශ්වයන් හි මධ්‍යම බලධාරීන්ට එකඟතාවයකට එළඹීමට නොහැකි අවස්ථාවල දී එම ආරාවුල් රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ සාකච්ඡා කිරීම මගින් විසඳා ගත යුතුය.

24 වන ව්‍යවස්ථාව

බලාත්මක කිරීම සංශෝධනය කිරීම සහ අවලංගු කිරීම

01. මෙම ගිවිසුම අපරානුමත කළ යුතුය. අපරානුමත කිරීමේ නිත්‍යානුකූල ලේඛන බීජිංහි දී හුවමාරු කළ යුතුය. අපරානුමත කිරීමේ නිත්‍යානුකූල ලේඛන හුවමාරු කර ගත් දිනට දින 30 කට පසුව මෙම ගිවිසුම බලාත්මක විය යුතුය.

02. දෙපාර්ශ්වය අතර ඇති කර ගන්නා ලිඛිත එකඟතාවයක් මගින් ඕනෑම අවස්ථාවක දී මෙම ගිවිසුම සංශෝධනය කළ හැකිය. එවැනි සංශෝධනයක් මෙම ව්‍යවස්ථාවේ 1 වන ඡේදය මගින් නියම කරනු ලබන පටිපාටිවලට අනුව බලාත්මක වන අතර ඒවා මෙම ගිවිසුමෙහි කොටසක් විය යුතුය.

03. මෙම ගිවිසුමට අදාළ වන දෙපාර්ශ්වයෙන් එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වයට රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ ලිඛිත දැනුම් දීමක් සිදු කිරීම මගින් ඕනෑම අවස්ථාවක දී මෙම ගිවිසුම අවලංගු කළ හැකිය. අවලංගු කිරීම බලාත්මක වන්නේ දැනුම් දීම සිදු කළ දින සිට 180 වන දිනයේ දී ය. එසේ වුවත් ගිවිසුම අවලංගු කිරීමට ප්‍රථම

සහයෝගිතාවය අපේක්ෂා කරමින් සිදු කරන ඉල්ලීම් ගිවිසුමේ නියම අනුව ක්‍රියාත්මක කළ යුතුය.

04. යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් මෙම ගිවිසුම බලාත්මක කිරීමට පෙරාතුව උද්ගත වූ විටක දී පවා මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීමෙන් පසු ව ඊට අදාල ඉල්ලීමට මෙම ගිවිසුම අදාල නොවේ.

මීට සාක්ෂි පිණිස අදාළ රාජ්‍යයන් වෙනුවෙන් විධිමත් පරිදි බලය පවරන ලද තැනැත්තන් විසින් මෙම ගිවිසුමට අත්සන් තබන ලදහ.

මෙම ගිවිසුම කොළඹදී 2014 සැප්තැම්බර් මස 16 වන දින දී සිංහල, චීන සහ ඉංග්‍රීසි භාෂාවලින් පිටපතක් සහිත ව අත්සන් තබන ලද අතර, ඒ සියළුම පිටපත් සමාන බලයෙන් යුක්ත වේ. මෙම ගිවිසුම සම්බන්ධයෙන් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට ඉංග්‍රීසි භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

මහජන චීන සමූහාණ්ඩුව
වෙනුවෙන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී
ජනරජය වෙනුවෙන්